**ශීර්ෂය 300 - ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 300 - ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ගණුදෙනු බේරා වසා දැමීමේ කටයුතු කරගෙන යාම සඳහා අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 සැප්තැම්බර් 26 දින දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම, ගණුදෙනු බේරා වසා දැමීමේ කටයුතු කරගෙන යාම සඳහා අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

-------------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

-----------------------------

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 228.37 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 194.65 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 33.72 ක් හෙවත් සියයට 14.77 ක් ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2015 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලයන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 206.69 | 192.64 | 14.05 | 6.80 |
| මූලධන | 21.68 | 2.01 | 19.67 | 90.73 |
| **එකතුව** | **228.37** | **194.65** | **33.72** | **14.77** |

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 30001 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 7.64 | 4.10 | 3.64 | 4.63 | 40.00 | 16.59 |

## 2.3 අග්‍රිම ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක **7**002/0000/00/0107/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 36.23 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුම් 4 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු. මිලියන 150.4 ක් විය. විස්තර පහත දැක්වේ.

| අග්‍රිම ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. මිලියන |
| 6000/0000/00/0008/0013/000 | 76.67 |
| 6000/0000/00/0016/0120/000 | 5.57 |
| 6000/0000/00/0013/0131/000 | 66.35 |
| 6000/0000/00/0001/0125/000 | 1.81 |
| **එකතුව** | **150.4** |

## 2.5 විගණන නිරීක්ෂණය

ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු කරගෙන යාම සඳහා අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

-----------------------------------------------

### 3.1 විසර්ජන ගිණුම

-------------------

#### 3.1.1 අයවැය විචලනය

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 2 ක් සඳහා සලසා තිබුණු රු. 10,200,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 10 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය, එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 ක සිට සියයට 93 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

### 3.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

---------------------------------------------

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

### 3.3 විගණන සාක්ෂි නොවීම

--------------------------

විස්තරාත්මක උපලේඛන, ශේෂ සනාථ කිරීම්, කාල විශ්ලේෂණ හා සමීක්ෂණ මණ්ඩල වාර්තා ආදී වූ අවශ්‍ය සාක්ෂි නොතිබීම නිසා රු. 1,099,644,390 ක් වූ ගිණුම් විෂයයන් 11 ක් සතුටුදායක ලෙස විගණනයේදී සන්නිරීක්ෂණය කිරිමට නොහැකි විය.

### 3.4 පොදු තැන්පත් ගිණුම

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 565(5) ප්‍රකාරව පොදු 71 ආකෘති පත්‍රයෙහි පිළියෙල කරන ලද තැන්පතු සාරාංශ ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අංක 6000/0000/00/0013/0131/000 දරන තැන්පත් ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට රු. 66,346,411 ක ශේෂය තුළ 1989 වර්ෂයේ සිට පැවත එන තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 3.5 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම

---------------------------------------

විෂය අංක 30001 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 3,217,808 ක් වූ අතර, එම හිඟ හිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 10 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණි. එම ණය ශේෂවලින් 2016 අගෝස්තු 31 දින වන විට රු. 94,810 ක් පමණක් අය කරගෙන තිබුණු අතර ඒ අනුව තව දුරටත් රු.3,122,998 ක් වූ ණය ශේෂ හිඟහිටව පැවැතුණි. එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

### 3.6 ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු කරගෙන යාම සඳහා අත්තිකාරම් ගිණුම

2003 දෙසැම්බර් 10 දිනැති අංක අමප/03/1176/126/017/ඊපීසී/445 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, අතිරේක අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක බීඩී/ඒඩීජ්සී/සීඕඑම්/එෆ්සී/එෆ්ඩී හා 2004 අගෝස්තු 23 දිනැති ලිපිය මඟින් ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වූ ආහාර මිලදී ගැනීමේ හා බෙදා හැරීමේ අත්තිකාරම් ගිණුම 2004 දෙසැම්බර් 31 දිනට වසා දැමීමට හා ඇවර කිරීමේ කටයුතු සඳහා දෙපාර්තමේන්තුව හෝ අමාත්‍යාංශය යටතේ ඇවර කිරීමේ ඒකකයක් පවත්වාගෙන යාමට උපදෙස් දී තිබුණි. එවැනි ඒකකයක් පත්කළ බවට සාක්ෂි නොවූ අතර එම ඇවර කටයුතු ආහාර කොමසාරිස් විසින් සිදුකර තිබුණි. එසේ වුවද, වසර 11 ක් ගතවී තිබියදීත් ඇවර කිරීමේ කටයුතු නිමකර නොතිබුණි.
ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඇවර කිරීමේ ඒකකයක් පත්කර තිබුණු බවට සාක්ෂි නොතිබුණද, 2005 ජනවාරි 01 දින සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා රු. 45,351,746 ක් වූ වත්කම්, ගැලපීම් හා උපලබ්ධි කිරීම්ද, රු.75,902 ක් වූ බැරකම්, ගැලපීම් හා පියවීම් සියල්ලම ආහාර කොමසාරිස් විසින් සිදු කර තිබුණු අතර ඒ සඳහා අනුමැතියක් ලබා ගත් බවට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) මෙම අත්තිකාරම් ගිණුම 2005 ජනවාරි 01 දින සිට ඇවර කරමින් පවතින අතර, මෙහි සමස්ථ පාඩුව රු. 981,398,869 ක් වී තිබුණි. එම පාඩුව කපා හැරීම, ගිණුම්ගත කිරීම, අදාළ ක්‍රියාපටිපාටිය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබාදීමට 2010 නොවැම්බර් 04 දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා රු.342,396,972 ක් කපාහැර තිබූ අතර තව දුරටත් කපා හැරීමට ඇති ශේෂය රු.639,001,897 ක් වුවද, එය මූල්‍ය ප්‍රකාශනවල රු. 598,640,879 ක් ලෙස රු.40,361,018 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ආහාර දෙපාර්තමේන්තුව විසින් බාහිර ආයතන වෙත කුලියට ලබාදී තිබුණු ගබඩා 61 කින් 2015 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ ගබඩා කුලීවල එකතුව රු.77,029,282 ක් විය. ඉන් ගබඩා 21 ක් මේ වන විට නැවත පවරාගෙන තිබුණද, කුලී හිමියන්ගෙන් අයවිය යුතුව ඇති එකතුව රු. 34,003,346 ක් වූ හිඟ කුලී 2016 ජූලි 31 දින දක්වා අයකර ගෙන නොතිබුණි.

(ඈ) ආයතන හා පුද්ගලයින් 13 ක් සඳහා බදු පදනම මත ලබාදී තිබූ ගොඩනැගිලි වෙනුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු එකතුව රු. 2,860,238 ක් වූ හිඟ විදුලි හා ජල ගාස්තු වලින් 2016 අගෝස්තු 31 වන විට තවදුරටත් රු. 1,445,725 ක් අයවිය යුතුව පැවතුණි.

(ඉ) 2015 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු එකතුව රු. 337,331,750 ක් වූ ණය ගැති ශේෂ අයකර ගැනීමේ ප්‍රගතිය ඉතා දුර්වල මට්ටමක පැවතුණි.

### 3.7 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

ඔරුගොඩවත්ත ගබඩා සංකීර්ණයේ හෙක්ටයාර් 4.05 ක් වූ භූමි කොටස හා ඒ තුළ ඉදිකර තිබුණු වර්ග අඩි 84,840 ක් වූ ගබඩා සඳහා ප්‍රධාන තක්සේරුකරුගේ මාසික තක්සේරු වටිනාකම රු.4,500,000 ක් වී තිබුණද, එම මුදල ඉතා අධික බවත්, සාධාරණ තක්සේරුවක් මත මෙම ගබඩා ලබාදෙන ලෙස බදුකරු ඉල්ලා තිබුණි. 2009 දෙසැම්බර් 17 දින ගොඩනැගිලි සඳහා පමණක් යැයි සඳහන් කර නැවත මාසිකව රු.2,465,000 ක් ලෙස තක්සේරු කර, වසර 30 ක් සඳහා එම බදුකරුට බදු දී මසකට රු.2,465,000 බැගින් කුලී අයකිරීම හේතුවෙන් භූමිය වෙනුවෙන් රජයට ලැබිය යුතු විශාල කුලී ආදායමක් අහිමි වී තිබුණි. එමෙන්ම හෙක්ටයාර 4.05 ක් වූ විශාල භූමිය වසර 30 ක් යනතෙක් දෙපාර්තමේන්තුවට කිසිදු ප්‍රයෝජනයක් ගැනීමටද නොහැකි වී තිබුණි. අවසාන තක්සේරුවේදී ඉහත කුලිය වසර 03 න් 03 ට ප්‍රතිශෝධනය කළ යුතු බව දන්වා තිබුණද, 2016 මාර්තු 31 දින වන විටත් කුලිය සංශෝධනය කර නොතිබුණි.

**3.8** **කාර්යසාධනය**

**-----------------**

2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව නිරීක්ෂණ පහත දැක්වේ.

**සැලැසුම් කිරීම**

**----------------**

2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාල සීමාව සඳහා දෙපාර්තමේන්තුව පිළියෙල කළ සංයුක්ත සැලැස්ම අනුව දෙපාර්තමේන්තුව සතුව මෙ. ටො. 50,000 ක ආරක්ෂිත සහල් තොගයක් පවත්වා ගෙන යාමට සැලැසුම් කර තිබුණි. ඊට අනුකූලව සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මෙහි 2015 වර්ෂයේදී මෙ. ටො. 28,000 ක සහල් ආරක්ෂිත තොගයක් පමණක් පවත්වා ගෙන යාම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් විය. එසේ වුවද 2015 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව සතුව සහල් ආරක්ෂිත සහල් තොගයක් පවත්වා නොතිබුණි.

**3.9** **කළමනාකරණ දුර්වලතා**

**--------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ)හදිසි ආපදා තත්ත්වයකදී පරිහරණය කිරීම සඳහා සහ වෙළඳපල මිල උච්චාවචනයන් ඇතිවන අවස්ථාවලදී වෙළඳපල වෙත සහල් සැපයීමේ අපේක්ෂාව ඇතිව හා දේශීය සහල් පරිභෝජනයේ හඳුනාගත හැකි අතිරික්තය අපනයනය කරා යොමු කරවීමේ අපේක්ෂා සහිතව ගුණාත්මක තත්ත්වයෙන් යුතු සහල් තොග පවත්වා ගැනීම දෙපාර්තමේන්තුවේ අරමුණ වී තිබුණි. ඒ අනුව 2012 වර්ෂයේදී රු.22,897,575 ක් වැය කර වේයන්ගොඩ අංක 10 ගබඩාව විද්‍යාත්මක ගබඩාවක් බවට පත්කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ගබඩාවේ මුළු ධාරිතාවය වූ මෙ. ටො. 5,400 න් පළමු අවුරුද්දේදී සියයට 12 ක් වූ මෙ.ටො.668 ක් සහල් ගබඩා කර තිබුණි. මෙම තොගය 2014 අප්‍රේල් මාසය වන විට විකුණා අවසන් වීමෙන් පසුව 2014 ඔක්තෝබර් 15 දින දක්වා ගබඩාව නිෂ්ක්‍රීයව තිබුණි. ඉන්පසුව 2014 ඔක්තෝබර් 16 දින සිට 2015 ඔක්තෝබර් 21 දින දක්වා රු.200,000 ක මාසික කුලී පදනම මත සමූපකාර තොග වෙළඳ සංස්ථාවට ලබාදී තිබුණද, 2016 අගෝස්තු 31 දින වන විටත් එම සංස්ථාවෙන් හිඟ කුලී සහ බිම් රාක්ක සඳහා අයවිය යුතු රු.1,159,401 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) 2015 ඔක්තෝබර් 22 දින සිට මෙම වාර්තාවේ දිනය දක්වාම ගබඩාව නිෂ්ක්‍රීයව පැවතුණි. ඒ අනුව විද්‍යාත්මක ගබඩාවක් බවට පත් කර වසර 04 ක් ආසන්න වී තිබුණද, මෙම ගබඩාව ස්ථාපිත කිරීමේ අරමුණ ඉටුකර ගැනීමට හෝ වැය කරන මුදලින් ඵලදායී ප්‍රතිඵල ලබාගැනීමට 2015 දෙසැම්බර් 31 දින වන විටත් දෙපාර්තමේන්තුවට නොහැකි වී තිබුණි.

(ආ) වේයන්ගොඩ ගබඩා සංකීර්ණයේ පැවැති අංක 11 ගබඩාව 2005 වර්ෂයේ සිට රජයේ තක්සේරු වාර්තාවක් නොමැතිව මසකට රු.50,000 කට පෞද්ගලික සමාගමකට බදු දී තිබුණි. මෙම සමාගම දිගින් දිගටම කුලී නොගෙවීම නිසා, හිඟ කුලී මුදල් අයකර ගැනීම සඳහාත් ගබඩාවේ සන්තකය ලබා ගැනීම සඳහාත් නඩු පවරා තිබුණි. නඩුව පැවරීමෙන් පසුව රු. ලක්ෂ 25 ක් පමණක් ගෙවා තිබුණද, 2016 අගෝස්තු 31 දින වන විටද, රු.1,861,493 ක මුදලක් අයවීමට තිබුණි.

(ඇ) ගැට්ටුවාන අංක 02 ගබඩාව 2003 වර්ෂයේ සිට 2018 අප්‍රේල් 09 දින දක්වා පෞද්ගලික සමාගමකට බදු දී තිබුණි. වර්ෂ 3 න් 3 ට ලබාගන්නා ලද තක්සේරු වාර්තා මත කුලී මුදල් අයකරගෙන නොතිබුණි. 2015 දෙසැම්බර් 31 දින වනවිටද මෙම සමාගමෙන් රු.1,178,304 ක් අයවීමට තිබුණු අතර, එය 2016 ජූලි 31 දින වන විට රු.954,216 ක් අයවීමට තිබුණි.

(ඇ) කටුගස්තොට ගබඩාව 2010 අප්‍රේල් 01 දින සිට 2018 ජූලි 31 දින දක්වා පෞද්ගලික ආයතනයකට බදු දී තිබුණි. මාසික කුලී මුදල් නියමිත පරිදි නොගෙවීම හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දින වන විට මෙම ආයතනයෙන් රු.3,633,680 ක මුදලක් දෙපාර්තමේන්තුවට අයවීමට තිබුණි. එය 2016 ජූලි 31 දින වන විට රු.4,320,720 ක් වී තිබුණි. මෙම හිඟ මුදල් අයකර ගැනීමට හෝ මේ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඉ) ඔරුගොඩවත්ත අංක 03 ගබඩාව 2003 දෙසැම්බර් 03 දින සිට 2015 දෙසැම්බර් 31 දින වන විටත් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව වෙත බදු දී තිබුණද, 2005 වර්ෂයෙන් පසු බදු කාල සීමාව දීර්ඝ කරගෙන නොතිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙන් රු. 4,464,426 ක් අය වීමට තිබුණු අතර, එය 2016 ජූලි 31 දින වන විට රු.7,551,922 ක් වී තිබුණි.

(ඊ) පල්ලෙකැලේ ආහාර ගබඩාව 2013 අගෝස්තු 02 දින සිට 2015 දෙසැම්බර් 31 දින වන විට පෞද්ගලික හිමිකරුවකුට බදු දී තිබුණද, ගබඩාව භාර දුන් දින සිට මේ දක්වා කිසිදු කුලී මුදලක් ගෙවා නොතිබුණි. ඒ අනුව 2015 දෙසැම්බර් 31 දින වන විට රු. 4,858,832 ක් දෙපාර්තමේන්තුවට අයවීමට තිබුණු අතර, එය 2016 ජූලි 31 දින වන විට රු.6,139,953 ක් වී තිබුණි. එසේ වුවද හිඟ කුලී අයකර ගැනීම සඳහා කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගැනීමට හෝ ගබඩාව ආපසු පවරා ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

(උ) වේයන්ගොඩ අංක 04 ගබඩාව 2010 මැයි 12 දින සිට වසරින් වසර දීර්ඝ කිරීමේ පදනම මත පුද්ගලික සමාගමකට බදු දී තිබුණද, 2012 මැයි 11 දිනෙන් පසුව 2016 අගෝස්තු 31 දින දක්වාම කුලී ගිවිසුම දීර්ඝ කරගෙන නොතිබුණි. 2015 දෙසැම්බර් 31 දිනට සමාගමෙන් අයවිය යුතු කුලිය රු. 878,832 ක් වූ අතර, එය 2016 ජූලි 31 දින වන විට රු.1,119,042 ක් වී තිබුණද කුලී අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඌ) දෙපාර්තමේන්තුවේ ගබඩා 08 ක් කුලී අය කිරීමකින් තොරව ලංකා සතොස වෙත ලබා දීම හේතුවෙන් 2015 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවට රු. 7,326,000 ක කුලී ආදායමක් අහිමි වී තිබුණි.

(එ) දෙපාර්තමේන්තුව සතු ගබඩා 12 ක් රාජ්‍ය සහ පෞද්ගලික ආයතන වෙත ලබා දී තිබූ අතර ඒ සඳහා අයවිය යුතු ගබඩා කුලිය 2015 දෙසැම්බර් 31 දිනට රු.23,937,273 ක් වූ තිබුණු අතර, එය 2016 ජූලි 31 දින වන විට රු.21,998,629 ක් වී තිබුණි.

(ඒ) රාජ්‍ය ආයතන වෙත කුලී රහිතව ගබඩා 39 ක් සහ කාර්යාල පරිශ්‍ර 04 ක් ලබා දීම හේතුවෙන් දෙපාර්තමේන්තුවට කිසිදු කුලී ආදායමක් ලැබී නොතිබුණි.

(ඔ) වේයන්ගොඩ විද්‍යාත්මක ගබඩාවේ ගබඩා කිරීම සඳහා 2012 හා 2013 වර්ෂයන්හිදී පෞද්ගලික සහල් මෝල් හිමියන් දෙදෙනෙකු වෙත සහල් ලබාදීමේ පදනම මත නිකුත් කරන ලද වී සඳහා රු. 6,724,121 ක්ද, ආපසු ලබා නොදුන් පොලිසැක් උර වෙනුවෙන් රු.79,567 ක්ද 2016 අගෝස්තු 31 දින වනවිටත් අයකරගෙන නොතිබුණි.

(ඕ) ඔරුගොඩවත්ත අංක 15 සහ 16 ගබඩා 2009 වර්ෂයට පෙර බදු ගෙන තිබූ සමාගමෙන් අයවියයුතු රු. 21,959,744 ක් සහ එම ආයතනයට ගෙවිය යුතු රු. 20,255,600 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.10** **මානව සම්පත් කළමනාකරණය**

**---------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**--------------------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 05 | 03 | 02 | - |
| (ii) | ද්විතියික මට්ටම | 115 | 46 | 69 | - |
| (iii) | තෘතියික මට්ටම | 03 | 01 | 02 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 107 | 62 | 45 | - |
| (v) | වෙනත් අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 02 | - | 02 |
| | **එකතුව** | **230** | **114** | **118** | **02** |